# මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
# நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
# MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/SAL/07
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.12. 29

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

<u>**කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 අනුව වැටුප් පරිවර්තන සිදු කිරීම.**</u>

2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලය සඳහා වන වැටුප් සංශෝධනය කිරීම සම්බන්ධයෙන් 2025.03.25 දිනැතිව කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 නිකුත් කර ඇත.

02. ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතන එම චක්‍රලේඛ උපදෙස් අනුව වැටුප් පරිවර්තනය හා අදාළ දීමනා ගෙවීම සිදු කර ඇති ආකාරය පිළිබඳව අහඹු පරීක්ෂාවක් 2026.01.31 දිනට ප්‍රථම ඒ ඒ ආයතන අභ්‍යන්තර විගණක සම්බන්ධ කර ගනිමින් අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කර නිවැරදිව අදාළ පරිවර්තන සිදු කර ඇති බවට තහවුරු කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලමි.

03. ඊට අදාළව පියවර ගැනීම පිළිබඳ තොරතුරු 2026.02.15 දිනට ප්‍රථම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත වාර්තා කිරීමටද පියවර ගත යුතුය.

04. රජය සතු ව්‍යාපාර වල සේවක සංඛ්‍යා හා පාරිශ්‍රමික කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ අදාලත්වය පිළිබඳව ඔබ වෙත යොමු කරන ලද මගේ අංක DMS/CAD/ALLOW හා 2025.10.03 දිනැති ලිපිය කෙරෙහිද ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

05. ඒ අනුව රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් ද ඇතුළත් සියලුම රාජ්‍ය අස්ථිත්වයන්ගේ සේවක සංඛ්‍යා කළමනාකරණය, වැටුප්, දීමනා හා වෙනත් ගෙවීම සම්බන්ධයෙන් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ රෙගුලාසි හා චක්‍රලේඛ නියමයන්ට අදාලව ක්‍රියාකළ යුතුය.

06. එබැවින් සියලුම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් වල නිලධාරීන්ගේ අතිකාල දීමනා ගණනය කිරීමේදී සාප්පු හා කාර්යාල පනතේ විධිවිධාන අදාල නොවන බවටත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි උපලේඛන I හි සඳහන් මාසික වැටුප 240න් බෙදා පැයකට හිමිවන අතිකාල දීමනාවේ අගය ගණනය කිරීම අනිවාර්ය වන බවටත් ඔබ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසද වැඩිදුරටත් දන්වමි.

ඒ.එන්.හපුගල
භාණ්ඩාගාරයේ ලේකම් (වැ.බ.) සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම් (වැ.බ.)

පිටපත් : 1. විගණකාධිපති